*සැ. යු.*- 2021.02.05 දින පළ වූ අංක 2,214 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,215 - 2021 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2021.02.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 82 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මාර්තු මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

81- B 082203 — 353 (2021/02)
D 1 -

# පිස්කල් විකිණීම්

## දඹුල්ල දිසා අධිකරණයේ දී ය

## විකිණීමේ දැන්වීමයි

මහනුවර, කටුගස්තොට පාර, අංක 187 හි සිය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන සෙරෙන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්

.............................පැමිණිලිකාර සමාගම.

මහනුවර දිසා අධිකරණයේ
නඩු අංකය : DMB 00059/17.
දඹුල්ල දිසා අධිකරණයේ
ඇස්කිසි අංකය : 04/2020

එදිරිව

1. සබරගමුවේ හෙට්ටිආරච්චිලාගේ අබේරත්න, අංක 05, වෙළඳ සංකීර්ණය පාර, දඹුල්ල.

2. සබරගමුවේ හෙට්ටිආරච්චිලාගේ ශානක මධුශංක හෙට්ටිආරච්චි. ''ජීවචිලා'', වෙළෙඳ සංකීර්ණ පෙදෙස, දඹුල්ල.

.......................................විත්තිකරුවන්.

වර්ෂ 2019 ක් වූ මැයි මස 16 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් අසූ හතර ලක්ෂ හැත්තෑ දහස (රු. 8,470.000.00) ක මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ ඡේදයන්හි සහනයක් ද ලබා ගැනීම සඳහා ආඥා කොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් අසූ හතර ලක්ෂ හැත්තෑ දහස (රු. 8,470,000.00) ක මුදල සහ පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරී පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ ඡේදයන්හි සහනයන් ද ලබා ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළට අයත් සියළුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයේ හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද සහ අනෙකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම්ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ, නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කිසි කලහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින්ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල, වර්ෂ 2021 ක් වූ මාර්තු මස 05 වන දින පෙ.ව. /ප.ව. 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹුල්ල නගර සභා සීමාව තුළ වගපනම පල්ලේසිය පත්තුවේ, මිරිස්ගෝනියාව ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, මිරිස්ගෝනියාව 05 වන කොටසෙහි පිහිටි කරටියගහමුල යාය නමැති ඉඩමට රජයේ මිනින්දෝරු තැන විසින් වර්ෂ 1998 ක් වූ මාර්තු මස 18 වන දින මැන බෙදා වෙන් කර සාදන ලද මුලික පිඹුරු අංක : මහ 1275 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක : 53 දරන කොටසට මායිම් උතුරට : කැබලි අංක 52 ද, නැගෙනහිරට : කැබලි අංක 47 සහ 55 ද, දකුණට : කැබලි අංක 54 ද සහ බස්නාහිරට කැබලි අංක : 4 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ තුනක් (අ. 0, රු. 0, පර්. 13) *හෙවත්* හෙක්ටයාර් 0.0329 ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ පළතුරු ආදී සියලු දේද සමග එකී මූලික පිඹුරු අංක : මහ 1275 දරන පිඹුරේ මාර්ග රක්ෂිතය සඳහා වෙන් වන කැබලි අංක : 4, හා 37 හි මාර්ග අයිතිය ද වේ.

මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක : L 62/134 හි ලියාපදිංචි වී ඇත.

එස්. එම්. එස්. සී. සමරකෝන්,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදාන විනිශ්චයකාර,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
දඹුල්ල.

වර්ෂ 2020 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින දී ය.

02-135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.